# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/20 – 2022 ඔක්තෝබර් 05 වැනි බදාදා – 2022.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2022 අංක 143 දරන ආඥාව**

මගේ යොමු අංකය: 68/69/පී/640/එල්ඒ/955.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BD/BW/LND/6/AQUIS/23.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 අගෝස්තු මස 17 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/ 6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, බණ්ඩාරවෙල.

2. **ඉඩමේ විස්තරය.–** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, මහපලට කෝරලේ සුළු කොට්ඨාසයේ, ඔබඩල්ලගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 119 හා 1971 පෙබරවාරි මාර්තු දිනැති අවසාන ගම් පිඹුරේ කැබලි අංක 107 වශයෙන් පෙන්නුම් කර ඇති පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 107 – හෝප් වත්ත – ප්‍රමාණය: අක්කර 07**

උතුරට: කැබලි අංක 1; නැගෙනහිරට: කැබලි අංක 1 සහ මාර්ගය; දකුණට: මාර්ගය; බටහිරට: මාර්ගය සහ කැබලි අංක 1.

EOG 10 - 0017

1A – G37690 – 34 (2022/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2022 අංක 68 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/13/2020/PC/293.
ප්‍රා. ලේකම්ගේ යොමු අංකය: DS/VW/LA/siddha medicine.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධාන ආඥාව යටතේ අංක 2269/60 හා 2022.03.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 1A පිටුවේ සිංහල භාෂාවෙන් පළකරන ලද මාගේ දැන්වීමේ "2021 අංක 68 දරන ආඥාව" යන්න වෙනුවට "2022 අංක 68 දරන ආඥාව" ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2022 අගෝස්තු මස 22 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/ 6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 10 - 0018